අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/11/02/01(I)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021.05. 28

චක්‍රලේඛ අංකය: 13/2021

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

**පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම.**

පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2019.05.24 දිනැති අංක 29/2019 චක්‍රලේඛය, ඊට අදාළ සංශෝධන සහ උපදෙස් ලිපි කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

ඒ අනුව, 2019.07.11 දිනැති අංක 29/2019 (I) චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලබන අතර, උක්ත 29/2019 චක්‍රලේඛයෙහි පහත වගන්තිවලට අදාළ උපදෙස් පමණක් 2022 වර්ෂයට හා ඉන් ඉදිරියට බලපැවැත්වෙන ලෙස පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

පහත දැක්වෙන එම සංශෝධනයන්ට අනුව මින් ඉදිරියට කටයුතු කළ යුතු අතර, ඉහත 29/2019 චක්‍රලේඛයෙහි මෙමඟින් සංශෝධනය නොවන විධිවිධාන හා 2020.05.26 දිනැති අංක 16/2020 දරන චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන ඒ ආකාරයෙන්ම බලපැවැත්වෙනු ඇත.

4.1 2022 හා ඉන් ඉදිරියට එක් සමාන්තර පන්තියකට සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගත යුතු ළමයින් සංඛ්‍යාව 35 ක් විය යුතුය. මෙයට අමතරව ක්‍රියාත්මක රාජකාරි අනුග්‍රහය යටතේ පංතියකට තෝරා ගනු ලබන ළමයින් සංඛ්‍යාව 5කි. ඒ අනුව එක් පංතියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 ක් වේ.

7.1.5 පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරන ලද පාසලට ඇති ආසන්නතාව සලකා බැලීමේදී අයදුම්කරුගේ නිවස (ප්‍රධාන දොරටුව) කේන්ද්‍රය කර ගෙන ඉල්ලුම් කරන පාසලේ ප්‍රධාන කාර්යාලයට (ප්‍රාථමික අංශය ප්‍රධාන පාසලින් බැහැර වෙනත් පරිශ්‍රයක පවතින්නේ නම් එම කාර්යාලයට) ඇති (අහස්) දුර අරය ලෙස ගෙන අඳින වෘත්තයක සීමාව තුළට ඇතුළත් වන පාසල් සඳහා ලකුණු අඩු කරනු ලැබේ. මෙහි දී ප්‍රධාන පාසලින් බැහැර ව වෙනම පරිශ්‍රයක ප්‍රාථමික අංශය පිහිටා ඇති පාසල් සම්බන්ධයෙන් ලකුණු අඩු කළ යුත්තේ, ප්‍රාථමික අංශය පිහිටි ස්ථානයට වන අතර ද්විතීයික අංශය පිහිටි ස්ථානයට නොවේ.

**යම් පාසලක් ඉහත වෘත්ත සීමාව තුළ පිහිටිය ද ගංගා, කලපු, වගුරුබිම්, රක්ෂිත වනාන්තර ආදී ස්වභාවික බාධාවන් හෝ අධිවේගී මාර්ග පවතින අවස්ථාවලදී පමණක් නිවසේ සිට එම පාසලට ගමන් කල හැකි කෙටිම මාර්ග දුර ඉල්ලුම් කරන පාසලට ඇති කෙටිම මාර්ග දුරට වඩා වැඩි නම් ලකුණු අඩු නොකළ යුතු ය.** එහිදී දෙමව්පියන් පිළිගත හැකි සාක්ෂි සහිතව මාර්ග සිතියම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

ඉහත අවස්ථාවන්හිදී ආසන්නතාව පරීක්ෂා කිරීම සඳහා රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති පරිමාණය 1:10000 සිතියම භාවිතා කළ යුතු අතර, ගැටලු සහගත අවස්ථාවක දී ගූගල් සිතියම ද (Google Map) සමග සංසන්දනය කර තීරණ ගත යුතුය.

ඉහත මාර්ග දුර ගණනයේදී ප්‍රායෝගිකව ගැටලු සහගත අවස්ථා විසඳාගැනීම සඳහා අවස්ථානුකූලව සාධාරණ හා පොදු තීරණයක් ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවලට බලතල හිමිවන අතර, එම තීරණ හේතු සහිතව සටහන් තබා ගත යුතු ය.

9.3.1 දෙවන ඡේදය පමණක් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

මේ සඳහා මෙම චක්‍රලේඛයේ 4.1 උප වගන්තියට අනුව, ඒ ඒ වර්ෂයේදී පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාවෙන් ක්‍රියාන්විත අනුග්‍රහය යටතේ ලබා දෙන පුරප්පාඩු අඩු කිරීමෙන් අනතුරුව අදාළ වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ මගින් තෝරාගත යුතු ශිෂ්‍ය ප්‍රමාණය තීරණය කළ යුතුය. 2022 වර්ෂයේ සිට ඉදිරියට සමාන්තර පන්තියකට සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 35 කි. තාවකාලික ලැයිස්තුවට අමතර ව, ලකුණු ප්‍රමුඛතා අනුව එක් එක් ගණයකින් වෙන වෙන ම පුරප්පාඩු සංඛ්‍යාව මෙන් 50%ක් වන සේ තාවකාලික පොරොත්තු ලේඛනයක් ද සකස් කළ යුතු ය.

මහාචාර්ය ඉක්.කපිල.සී.කේ.පෙරේරා
අධ්‍යාපන ලේකම්